# 8 ශ්‍රේණිය සිංහල

## 08 ඒකකය - 2022

# ප්‍රායෝගික ලේඛන



සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

08 ශ්‍රේණිය පෙළ පොත අභ්‍යාස සහ පිළිතුරු ද ඒකකයට අදාළ ආදර්ශ ප්‍රශ්න පත්‍ර 2ක් සහ පිළිතුරු ද අන්තර්ගත කර ඇත.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# 08. ප්‍රායෝගික ලේඛන

එදිනෙදා ජීවිතයේ දී අපට විවිධ අවශ්‍යතා සඳහා සැකසීමට සිදු වන විවිධ ලේඛන ප්‍රායෝගික ලේඛන ලෙස දැක්විය හැකි ය. ප්‍රායෝගික ලේඛනයට සම්මත ආකෘතිය අනුගමනය කිරීම ඉතා වැදගත් ය. උදා:




- ✓ රාජකාරි ලිපි
- ✓ ව්‍යාපාරික ලිපි
- ✓ පෞද්ගලික ලිපි
- ✓ වාර්තා
- ✓ අත් පත්‍රිකා
- ✓ දැන්වීම්
- ✓ ආරාධනා පත්‍ර
- ✓ න්‍යාය පත්‍ර ආදිය

කවර වර්ගයේ ප්‍රායෝගික ලේඛනයක දී වුව ද නිවැරදි අක්ෂර වින්‍යාසය, විරාම ලක්ෂණ යෙදීම සහ නිරවුල් අදහස් ප්‍රකාශනය අත්‍යවශ්‍ය ය. මෙම පාඩමෙන් දැන්වීම් සහ ආකෘති පත්‍ර සැකසීම සම්බන්ධව ඔබේ අවධානය යොමු කිරීමට අපේක්ෂිත ය.

## I. දැන්වීම් පත්‍ර

- දැන්වීම් පත්‍රිකාවක ගැබ් විය යුතු අනිවාර්ය ලක්ෂණ කිහිපයකි.
  - ✓ කරුණු නිවැරදිව පැහැදිලිව දැක්වීම
  - ✓ සංක්ෂිප්තභාවය
  - ✓ ආකර්ෂණීයභාවය
  - ✓ සරලබව






# පොලිතීන් රකුසෙකි
# අප සැම වනසන

පොලිතීන්
ඛනිජ තෙල් පිරිපහදුවෙන් පසු
ඉවත් කරන ප්‍රාථමික පෙට්‍රෝ
රසායනික ද්‍රව්‍ය
ආශ්‍රිත නිෂ්පාදනයකි.
සාර්ථක හා පහසු
ඇසුරුම් මාධ්‍යයකි.
මිනිසා පොලිතීන්
භාවිතයට කෙතරම් යොමු වී
ඇත් ද යත්
භාවිතය අවම කිරීමට මිස
සම්පූර්ණයෙන් නතර කළ
නො හැකි
තත්ත්වයක් උදා වී ඇත.
පොලිතීන් මගින් පරිසරයට හානි සිදු වන්නේ
ඒවා බැහැර කිරීමේ දී ය.
පොලිතීන් මුළුමනින් ම දිරා යාමට වසර **200**ක්
පමණ කල් ගත වන්නේ යැයි ගණනය කර තිබේ.
සියලු දෙනා අතින් අඛණ්ඩව
පොලිතීන් පරිසරයට බැහැර වීම සිදු වන කල්හි
ඉන් ඇති වන හානිය නම් ගණනය කළ නො හැකි ය.



## පොලිතීන්වලින් සිදු වන හානි

- භූමි දූෂණය නිසා පාංශු ජීවීන් විනාශ වීම හා පස නිසරු වීම
- ජල දූෂණය හෙවත් ජලයේ ගුණාත්මකභාවය වෙනස් වීම
- කසළ ආහාරයට ගැනීමට එන අලින්, ගවයන්, මුවන්, කපුටන් ආදී සතුන් විවිධ රෝගාබාධවලට ලක් වී මිය යෑම
- කානු පද්ධති අවහිර වී මදුරුවන් හා මැස්සන් බෝ වීම ඇතුළු විවිධ අපහසුතා ඇති වීම

මේ සියලු හේතු නිසා පාරිසරික සමබරතාව බිඳී යයි.

## පොලිතීන් වෙනුවට භාවිත කළ හැකි විකල්ප

- පන් වර්ගවලින් තනාගන්නා මලු
- බට පතුරුවලින් තනාගන්නා ඇසුරුම්
- පොල්, තල් ආදි ශාක පත්‍රවලින් තනාගන්නා මලු
- කඩදාසි දවටන
- රෙදි මලු
- නෙලුම්, කැන්ද, දිය හබරල, කෙසෙල් ආදි ශාක පත්‍ර

භාවිතය අවම කිරීම හෙවත් වරක් භාවිත කළ පොලිතීන් මලු නැවත භාවිතය මගින් ද පරිසරයට මුදා හැරෙන පොලිතීන් ප්‍රමාණය සීමා කළ හැකි ය.

එහෙත්

ඉන් සිදු වන දීර්ඝකාලීන අපහසුතා සහ හානි ප්‍රමාණ කළ නො හැකි ය.
අපගේ පැවැත්ම තීරණය වන්නේ පරිසරය සුරැකුණ හොත් පමණි.
අන් කිසිදු සතකු පරිසරය විනාශ නො කරන නිසා
පරිසරය සුරැකීමේ වගකීම මුළුමනින් ම ඇත්තේ මිනිසාට පමණි.
පොලිතීන් මිතුරු වෙසින් එන සතුරෙකි.
එය අත්‍යවශ්‍ය ද්‍රව්‍යයක් කර ගෙන ඇත්තේ අප ම ය.
එය අනවශ්‍ය ද්‍රව්‍යයක් ලෙස බැහැර කළ යුත්තේ ද අප ම ය.
මිහිමව සනසන සැබෑ දරුවන් ලෙස
අපි සියලු දෙනා පොලිතීන් භාවිතයෙන් ඈත් වෙමු.
නො දිරන පොලිතීන් භාවිත නො කරන ඔබගේ නාමය නො දිරන්නේ ය.

**හැකි සෑම විටක ම පොලිතීන් වෙනුවට විකල්ප භාවිත කරමු !**

දිනය: **2017.05.02**

පරිසර නියමු හට කණ්ඩායම,
නෙලුම් වැව මහා විද්‍යාලය.




- **ලිඛිත අභ්‍යාස (Home Work)**

1. පහත දැක්වෙන කරුණු උපයෝගී කර ගනිමින්, '**ළමා අපයෝජනයට වැට බඳිමු**' යන මාතෘකාව යටතේ පාසල් ප්‍රජාව දැනුවත් කිරීමට සුදුසු දැන්වීම් පත්‍රිකාවක් පිළියෙල කරන්න.
   - ✓ ළමයකු ලෙස සැලකෙන්නේ වයස අවුරුදු 18ට අඩු අය වේ.
   - ✓ එක්සත් ජාතීන්ගේ ළමා ප්‍රඥප්තියෙන් ළමා අපයෝජනය පිටුදැකිය යුතු බව සම්මත කරගෙන ඇත.
   - ✓ ළමයා අපයෝජනය වන විධි
     - ළමා මෙහෙකාර සේවාව
     - ළමා සොල්දාදු සේවාව
     - ලිංගික අතවරයට ලක් වීම
     - කුට්ටනය හෙවත් ළමා වෙළඳාම
     - කායික මානසික හිංසනය
     - නොතකා හා නො සලකා හැරීමට ලක් වීම
     - අධ්‍යාපන අයිතිය ලබා නො දීම
   - ✓ ළමා ආරක්ෂාව පිණිස පිහිටුවා ඇති ආයතන
   - ✓ ළමා අපයෝජන පිළිබඳව දැනුම් දිය යුතු දුරකථන අංක

# ළමා අපයෝජනයට වැට බඳිමු

✓ **වයස අවුරුදු 18ට අඩු අය ළමයකු සේ සැලකේ.**

**එක්සත් ජාතීන්ගේ ළමා ප්‍රඥප්තියෙන් ළමා අපයෝජනය පිටුදැකිය යුතු බව සම්මත කරගෙන ඇත.**




✓ **ළමයා අපයෝජනය වන විධි**

- අධ්‍යාපන අයිතිය ලබා නො දීම
- ළමා මෙහෙකාර සේවාව
- ළමා සොල්දාදු සේවාව
- ලිංගික අතවරයට ලක් වීම
- කුට්ටනය හෙවත් ළමා වෙළඳාම
- කායික මානසික හිංසනය
- නොතකා හැරීමට ලක් වීම
- නො සලකා හැරීමට ලක් වීම

✓ **ආදරණීය දරුපැටියාට සිදුවන අතවර වලින් වළක්වා ගන්න ක්‍රම දහයක්**

- දරුවා ඉන්නේ කා සමගද?
- දරුවාට කොන්දේසි නොමැතිය ආදරය කරන්න.
- තනි නොකරන්න.
- විදේශගත නොවන්න.
- දරුවා සමග කතා කරන්න.
- අසභ්‍ය දර්ශන දරුවාගෙන් ඈත් කරන්න.
- දරුවාගේ වෙනස්වීම් හඳුනාගන්න.
- ඔබේ හැසිරීම් පාලනය කරන්න.
- ගමන් යැවීමෙන් වළකින්න.
- අඬන්නට පෙර සූදානම් වන්න.

**ළමා අපයෝජන පිළිබඳව දැනුම් දෙන්න**

"මේ සමාජය ඔබ සිතන තරම් විශ්වාස කළ නොහැක. දරුවන් බිලිගන්නට සිටින රාක්ෂයින්ගෙන් දරුවා ආරක්ෂා කරගෙන උඩුගම් බලා පිහිනීමට ඔබට සිදුව තිබේ. එබැවින් අද දරුවා ආරක්ෂා කරන්න. එවිට ඔබට හෙට දවසේ අඬන්නට කිසිවක් සිදු නොවනු ඇත."

## II. ආකෘති පත්‍ර

- එදිනෙදා ජීවිතයේ දී අපට විවිධ ආයතන සමග කටයුතු කරන්නට සිදු වේ. එහිදී ඒ ඒ ආයතනවලින් විවිධ ආකෘති පත්‍ර නිකුත් කෙරෙන්නේ පහසුවෙන් අවශ්‍ය සේවා සම්පාදනය සඳහා ය. උදා:
  - ✓ රැකියා ඉල්ලුම් පත්‍ර
  - ✓ විදුලි පණිවිඩ පත්‍රිකා
  - ✓ මූල්‍ය බැංකුවක මුදල් තැන්පත් කිරීමේ දී හා ලබා ගැනීමේ දී සම්පූර්ණ කළ යුතු පත්‍රිකා
  - ✓ පාසලකට ඇතුළත් වීම සඳහා ඇති ඉල්ලුම් පත්‍රය
  - ✓ කිසියම් සංවිධානයක සාමාජිකත්වය ඉල්ලුම් කිරීම
  - ✓ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ඉල්ලුම් කිරීම

- ආකෘති පත්‍රයක් පිරවීමේ දී සැලකිය යුතු කරුණිඑදිදුදා:
  - ✓ ආකෘති පත්‍රය පිරවීම සඳහා උපදෙස් දී ඇත්නම් ඒවා කියවිය යුතු ය.
  - ✓ ආකෘති පත්‍රයේ සඳහන් කරුණු හොඳින් කියවා තේරුම් ගෙන අසා ඇති තොරතුරු සම්පූර්ණ කළ යුතු ය.
  - ✓ සඳහන් කළ යුතු කරුණු ඉතා කෙටියෙන් දැක්විය යුතු ය.
  - ✓ සුපුරුදු අත්සන යෙදිය යුතු ය.
  - ✓ සත්‍ය වූ ද නිවැරදි වූ ද තොරතුරු දැක්විය යුතු ය.
  - ✓ තමා විසින් සම්පූර්ණ නොකළ යුතු තැන් ඇතොත් ඒවා හිස්ව තැබිය යුතු ය. (ඒවා කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා ය.)
  - ✓ මකන දියර වර්ග භාවිත නොකළ යුතු ය.
  - ✓ වැරදුණ හොත් තනි ඉරකින් කපා කෙටි අත්සනක් යෙදිය යුතු ය.

### ජීවදත්ත පත්‍රිකාවක ආකෘතිය

| | |
|---|---|
| මුලකුරු සමග නම | :- C.U.A. පතිරත්න |
| සම්පූර්ණ නම | :- චේතන උෂාන් අබේවර්ධන පතිරත්න |
| ස්ථිර ලිපිනය | :- 193 ඩීන්ස් පාර, මරදාන, සුදුවැල්ල, කො. 10 |
| ස්ත්‍රී/පුරුෂ භාවය | :- පුරුෂ |
| ජාතිය | :- ශ්‍රී ලාංකික |
| ජනවර්ගය | :- සිංහල |
| පළාත | :- බස්නාහිර පළාත |
| දිස්ත්‍රික්කය | :- කොළඹ |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | :- තිඹිරිගස්යාය |
| ජාතික හැඳුනුම්පත් අංකය | :- නිකුත් කර නැත |
| විවාහක/ අවිවාහක භාවය | :- අවිවාහක |
| ග්‍රාමසේවා කො. හා අං. | :- සුදුවැල්ල 1-1-03-140 C 34 |

උපන් දිනය :- 2009 - 03 - 12
අධ්‍යාපන සුදුසුකම් :- 8 ශ්‍රේණියට සමත්
වෘත්තීය සුදුසුකම් :- නැත
ක්‍රීඩා හා විශේෂ දක්ෂතා :- මලල ක්‍රීඩා (කෙටි දුර), පංති නායක

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික වෙමි.

දිනය :- 2022 - 07 - 20

.............................
අත්සන

## අවබෝධය

1. ප්‍රායෝගික ලේඛන වර්ග පහක් නම් කරන්න.
2. දැන්වීම් පත්‍රිකාවක් පිළියෙල කිරීමේ දී සැලකිලිමත් විය යුතු මූලික කරුණු තුනක් දක්වන්න.
3. ආකෘති පත්‍රයක අත්සන යෙදීමේ දී අවධානය යොමු කළ යුතු කරුණ කුමක් ද?
4. පොලිතීන් වෙනුවට අප භාවිත කළ යුත්තේ දිරනසුලු ද්‍රව්‍යවලින් නිෂ්පාදිත මලු සහ ඇසුරුම් ය. ඊට ගත හැකි ද්‍රව්‍ය මොනවා ද?
5. පොලිතීන් මිනිසාගේ සෞඛ්‍යයට අහිතකර වන ආකාරය පැහැදිලි කරන්න.

- **අවබෝධය**

1.
- රාජකාරි ලිපි
- ව්‍යාපාරික ලිපි
- පෞද්ගලික ලිපි
- වාර්තා
- අත් පත්‍රිකා
- දැන්වීම්
- ආරාධනා පත්‍ර
- න්‍යාය පත්‍ර

2.
- කරුණු නිවැරදිව පැහැදිලිව දැක්වීම
- සංක්ෂිප්තභාවය
- ආකර්ෂණීයභාවය
- සරලබව

3. ● සුපුරුදු අත්සන යෙදිය යුතු ය.

4. ● පන් වර්ගවලින් තනාගන්නා මලු
● බට පතුරුවලින් තනාගන්නා ඇසුරුම්
● පොල්, තල් ආදි ශාක පත්‍රවලින් තනාගන්නා මලු
● කඩදාසි දවටන
● රෙදි මලු
● නෙලුම්, කැන්ද, දිය හබරල, කෙසෙල් ආදි ශාක පත්‍ර

5. ● භූමි දූෂණය නිසා පාංශු ජීවීන් විනාශ වීම හා පස නිසරු වීම
● ජල දූෂණය හෙවත් ජලයේ ගුණාත්මකභාවය වෙනස් වීම
● කසළ ආහාරයට ගැනීමට එන අලින්, ගවයන්, මුවන්, කපුටන් ආදී සතුන් විවිධ රෝගාබාධවලට ලක් වී මිය යෑම
● කානු පද්ධති අවහිර වී මදුරුවන් හා මැස්සන් බෝ වීම ඇතුළු විවිධ අපහසුතා ඇති වීම

- **ලිඛිත අභ්‍යාස (Home Work)**

2. නගර සභාව යටතේ පාලනය වන මහජන පුස්තකාලයට සාමාජිකයන් බඳවා ගැනීම සඳහා සුදුසු ආකෘති පත්‍රයක් පිළියෙල කරන්න.

**ජීවදත්ත පත්‍රිකාවක ආකෘතිය**

| | |
|---|---|
| මුලකුරු සමග නම | :- C.U.A. පතිරත්න |
| සම්පූර්ණ නම | :- චේතන උෂාන් අබේවර්ධන පතිරත්න |
| ස්ථිර ලිපිනය | :- 193 ඩීන්ස් පාර, මරදාන, සුදුවැල්ල, කො. 10 |
| ස්ත්‍රී/පුරුෂ භාවය | :- පුරුෂ |
| ජාතිය | :- ශ්‍රී ලාංකික |
| ජනවර්ගය | :- සිංහල |
| පළාත | :- බස්නාහිර පළාත |
| දිස්ත්‍රික්කය | :- කොළඹ |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | :- තිඹිරිගස්යාය |
| උපන් දිනය | :- 2009 - 03 - 12 |
| විවාහක/ අවිවාහක භාවය | :- අවිවාහක |
| ග්‍රාමසේවා කො. හා අං. | :- සුදුවැල්ල 1-1-03-140 C 34 |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික වෙමි.
දිනය :- 2022 - 07 - 20

..............................
අත්සන

# ගුරු අත් පොතෙන්...

- **ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු**

  ✓ නිවැරදි ව ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීමට යොමු කරන්න.
  ✓ නිවැරදි තොරතුරු ඇතුළත් කිරීම.
  ✓ නිවැරදි හා පිරිසිදු ව සම්පූර්ණ කිරීම.
  ✓ මකන දියර වර්ග භාවිත නො කිරීම.
  ✓ වැරදුණහොත් තනි ඉරකින් කපා කෙටි අත්සනක් යෙදීම.
  ✓ එක් අත්සනක් පමණක් භාවිත කිරීමට හුරු කිරීම.

- **ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීම**

විවිධ ආයතනවලින් නොයෙක් කාර්යයන් ඉටුකර ගැනීමේ දී විවිධාකාරයේ ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීමට සිදු වේ. ආකෘති පත්‍ර මගින් ලබා ගන්නා තොරතුරු මත එම ආයතන අපගේ කටයුතු ඉටු කර දීමට යොමු වේ. එම කාර්යය පහසුවෙන් ඉටු කර දීම සඳහා නිවැරදි තොරතුරු ඇතුළත් කිරීම අත්‍යවශ්‍ය කරුණකි. ඒ සම්බන්ධ ව කටයුතු කරන නිලධාරීන්ට නිවැරදි තොරතුරු සැපයීමට සිදු වන බව පෙන්වා දෙන්න. ආකෘති පත්‍ර, ඉල්ලුම් පත්‍ර හා වෙනත් ලිපි ලේඛන සකස් කිරීමේ දී අපගේ ජීව දත්ත තොරතුරු මෙන් ම අනෙකුත් වැදගත් තොරතුරු නිසි පරිදි ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ. ශිෂ්‍යයන්ට අදාළ ව පහත සඳහන් තොරතුරු ගොනු කර ගැනීමට උපදෙස් ලබා දෙන්න. ඇතැම් ආකෘති පත්‍රවල අවසානයේ ඇතුළත් කරන තොරතුරු සියල්ල නිවැරදි බවත් සත්‍ය බවත් සඳහන් කළ යුතු බව පෙන්වා දෙන්න. ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීමේ දී මේ බව ශිෂ්‍යයන්ට පැහැදිලි කර දෙන්න.

- **ඇගයීම හා තක්සේරුකරණය**

  ✓ විවිධ ආකෘති පත්‍ර හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
  ✓ ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීමේ දී නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.
  ✓ නිවැරදි තොරතුරු ඇතුළත් කරමින් තම අවශ්‍යතා ඉටුකර ගැනීමට ආකෘති පත්‍ර සම්පූර්ණ කරයි.

## ඇමුණුම 1 - ආකෘති පත්‍රය සම්පූර්ණ කරන්න.

01 මුලකුරු සමග නම : ..............................................................................................................

02. තැපැල් ලිපිනය : .................................................... විද්‍යුත් ලිපිනය : ........................................

03. උපන් දිනය : ....................................................

04 ........................ දිනට වයස: ....................................................

05. ජාතික හැඳුනුම්පත් අංකය: ....................... පුරවැසි භාවය: ......................... ජාතිය : .........................

06. දූරකථන අංකය ස්ථාවර : ........................................... ජංගම : ...........................................

07. ස්ත්‍රී පුරුෂ භාවය : ස්ත්‍රී ☐ පුරුෂ ☐

08. ස්ථිර පදිංචි පළාත : ..............................................................................................................

09. දිස්ත්‍රික්කය : ..................................................................

10. ඡන්ද බල ප්‍රදේශය : ..................................................................

11. ග්‍රාම නිලධාරි කොට්ඨාසය : ..................................................................

12. අධ්‍යාපනය ලද පාසල/පාසල් : ....................................................................

13. අධ්‍යාපන සුදුසුකම් :

| විභාගයේ නම හා වර්ෂය | විෂය | ලබාගත් සාමර්ථ්‍යය |
|---|---|---|
| | | |

ඉහත දක්වන ලද තොරතුරු නිවැරදි බවටත් සත්‍ය බවටත් ප්‍රකාශ කරමි.

## ඇමුණුම 2 - ආකෘති පත්‍රයක ඇතුළත් විය යුතු මූලික තොරතුරු

1. මුල'කුරු සමග නම :

2. උපත් දිනය :

3. ස්ත්‍රී/පුරුෂ භාවය :

4. විවාහක/අවිවාහක බව :

5. පුරවැසි භාවය :

6. වෘත්තිය :

7. රාජකාරි ලිපිනය :

8. පෞද්ගලික ලිපිනය :

9. විද්‍යුත් ලිපිනය :

10. දූරකථන අංකය

11. හැඳුනුම්පත් අංකය :

12. පළාත :

13. දිස්ත්‍රික්කය:

14. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :

15. මැතිවරණ කොට්ඨාසය :

16. පොලිස් බල ප්‍රදේශය :

17. පළාත් සභා බල ප්‍රදේශය :

18. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය :

19. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :

20. ග්‍රාම නිලධාරි අංකය :

21. ඉගෙනුම ලැබූ පාසල :

22. අධ්‍යාපන සුදුසුකම් :

23. වෙනත් සුදුසුකම් :

NALANDA VIDYALAYA

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

| 8 ශ්‍රේණිය | සිංහල | කාලය පැය 1 |
|---|---|---|

01) කෝවිඩ් 19 හෙවත් කොරෝනා මර්දනය සඳහා ජනතාව දැනුවත් කිරීම සඳහා සුදුසු දැන්වීම් පත්‍රිකාවක් සකස් කරන්න.

අදාළ කරගත හැකි කරුණු,

- කොරෝනා හෙවත් කොවිඩ් 19 මර්දනයට ගත හැකි පියවර
- තත්පර 20 ක් සබන් හෝ විෂබීජ නාසන දියරයකින් දෑත් සේදීම
- සමාජ දුරස්තභාවය රැක ගැනීම
- මුඛ ආවරණ සහ අත් ආවරණ පැළඳීම
- භාණ්ඩ මිලදී ගැනීමේදී හා විකිණීමේදී සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරීම.
- පොදු ප්‍රවාහන සේවා පරිහරණයේදී සැලකිලිමත් වීම.
- පාසැල් හා පොදු ස්ථාන විෂබීජ හරණය කිරීම
- බිඳිති මාර්ගයෙන් මෙම රෝගය අන් අයට බෝවේ.
- වෛරස් මගින් බෝවෙන රෝගයකි.
- දැනට නිශ්චිතව ප්‍රතිකාරයන් සොයාගෙන නොමැත.
- උණ, කැස්ස, සෙම්ප්‍රතිශ්‍යාව, හුස්ම ගැනීමේ අපහසුව ඇතිකරයි. මරණය පවා ඇතිකළ හානිය.
- වෙනස් බෝ නොවන රෝග සහිත අයට අවධානම වැඩිය.
- කුඩා දරුවන් සහ වයස්ගත අයට රෝගය බෝවූ විට අතුරු ආබාධ ඇති වීම වැඩිය.
- දේශීය ප්‍රතිශක්තිය කරන ක්‍රම වන කොත්මල්ලි, වෙනිවැල්ගැට, සුදුලූණු, ඉඟුරු, පත්පාඩගම් ආදිය, පානයාකිරීම, වාෂ්ප දුම ඇල්ලීම, විවේකය ආදිය තුළින් රෝගයම අවශ්‍ය ප්‍රතිශක්තිය දියුණු කළ හැකිය.

විද්‍යාලයීය සෞඛ්‍යදාන ව්‍යාපාරයේ නියමු භට කාණ්ඩය නාලන්දා විද්‍යාලය කොළඹ 10.

02) ආකෘති පත්‍රයක් පිරවීමේදී ඔබ අවධානයට ගත යුතු කරුණු මොනවාද? එහිදී තම අත්සන තැබීමේදී සැලකිළිමත් විය යුතු කරුණු කුමක්ද?

03) දිනිඳු නුගවෙල වන ඔබ පාසල් අධ්‍යාපනයෙන් පසුව දැන් සුදුසු රැකියාවක් බලාපොරොත්තුවෙන් සිටියි. රැකියා ඉල්ලුම් පත්‍රයකත් සැකසීමට අවශ්‍ය ජීවදත්ත ඔබ සතුව පවතී. ඔබේ ජීවදත්ත ඇතුළත් කර "සින්ටෙක්ස්" පෞද්ගලික ආයතනයේ කළමණාකාර තුමාට රැකියාවක් සඳහා ඉල්ලුම් පත්‍රයක් යොමු කරන්න. (මේ සඳහා ඔබගේ පෙළ පොතේ අදාළ පාඩමේ ජීව දත්ත පත්‍රිකාවේ ආකෘතිය භාවිත කරන්න.

# ප්‍රායෝගික ලේඛන

## ක්‍රියාකාරකම 1

සුදුසු පිළිතුර තෝරා පහත සඳහන් වාක්‍ය සම්පූර්ණ කරන්න .

1. එදිනෙදා ජීවිතයේදී අපට අවශ්‍ය වන විවිධ ලේඛන ……..………………..නම් වේ .

   i රාජකාරි ලිපි  ii ජීවදත්ත පත්‍රිකා  iii ප්‍රායෝගික ලේඛන  iv ඉල්ලුම් පත්‍ර

2 . දැන්වීම් පත්‍රයක අත්‍යවශ්‍ය ලක්ෂණයක් වන්නේ ………………………….. ය .

   i ලබන්නාගේ ලිපිනය  ii ආශිර්වාදය  iii සංක්ෂිප්ත බව  iv . දැනුම් දෙන්නෙකු සඳහන් නොවීම

3. ප්‍රබල ප්‍රචාරණ උපක්‍රමයක් ලෙස …………………….. යොදා ගැනේ .

   i ආකෘති පත්‍ර  ii දැන්වීම් පත්‍ර  iii පෞද්ගලික ලිපි  iv රාජකාරි ලිපි

4 . විවිධ ආයතන සමග කටයුතු කරන්නට …............................... අවශ්‍ය වේ .

   i දැන්වීම් පත්‍ර  ii ආකෘති පත්‍ර  iii ජීවදත්ත පත්‍රිකා  iv පෞද්ගලික ලිපි

5. ආකෘති පත්‍රයක අත්‍යවශ්‍ය ලක්ෂණයක් **වන්නේ** ………………………….. ය .

   i ලබන්නාගේ ලිපිනය  ii අත්සන  iii ආකර්ෂණීය බව  iv ආශිර්වාදය

## ක්‍රියාකාරකම 2

පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් √ ලකුණ ද වැරදි නම් X ලකුණ ද යොදන්න

| | |
|---|---|
| 1. ප්‍රායෝගික ලේඛන සඳහා සම්මත ආකෘතියක් නැත . | |
| 2. සංක්ෂිප්තභාවය දැන්වීම් පත්‍රිකාවක අත්‍යවශ්‍ය ලක්ෂණයකි . | |
| 3. කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා සඳහන්ව ඇති තැන් සම්පූර්ණ කළ යුතු ය . | |
| 4. සෑම ආකෘති පත්‍රයකට ම අවශ්‍ය ජීවදත්ත තොරතුරු සමාන නැත . | |
| 5. දැන්වීම් පත්‍රිකාවකින් පොදු ජනයා නොදන්නා කරුණු ලබාදීම අවශ්‍යය . | |
| 6 . වැරදුණු තැන් තනි ඉරකින් කපා කෙටි අත්සන යෙදිය යුතු ය . | |
| 7. අයදුම් පත සම්පූර්ණ කර අවසානයේ අත්සන යෙදීම අවශ්‍ය නොවේ . | |
| 8 . නියමිත තැන්වල දැන්වීම් ඇලවීම පරසර හිතකාමී වේ . | |
| 9. දැන්වීම් සකස් කිරිමට විවිධ ප්‍රමාණයේ අකුරු භාවිත කළ හැකිය . | |
| 10. දැන්වීම් පත්‍රිකාවක ට විවිධ වර්ණ භාවිත නො කළ යුතු ය . | |

## ක්‍රියාකාරකම 3

දැන්වීම් පත්‍රිකා ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1 . ඛනිජ තෙල් පිරිපහදුවෙන් ඉවත් කරන පෙට්‍රෝ රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත …………………… නිෂ්පාදනය කෙරේ .

2 . භූමිය දූෂණය වීම නිසා …………………. හා පස නිසරු වීම සිදු වේ .

3 . පොලිතින් සම්පූර්ණයෙන් ම දිරාපත් වීමට වසර …………………….. කාලයක් ගත වේ .

4 . පොලිතින් මලු වෙනුවට ……………………….. මලු භාවිත කළ හැකිය .

5 . අපගේ පැවැත්ම තීරණය වන්නේ …………………………සුරකුණොත් පමණි .

6 . පොලිතින් ……………… වෙසින් එන රකුසෙකි .

7 . කෑම ඇසුරුම් කිරීමට ගත හැකි ගාක පත්‍ර විශේෂයකි ……………………. කොළ .

8 . කසළ ආහාරයට ගැනීම නිසා ………………… රෝගාබාධවලට ලක් වේ .

පාංශු ජීවීන් විනාශ වීම , කෙසෙල් , පරිසරය , මිතුරු , සතුන් ,

පොලිතින් , දෙසීයක , පන්

## ක්‍රියාකාරකම 4

**ගැළපෙන කරුණු යා කරන්න**

★ සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් දී තිබේ දැයි පරීක්ෂා කිරීම

★ නම ලිපිනය ලිවීමට කොටු තිබීම

★ විවිධ ප්‍රමාණයේ අකුරු භාවිත

★ සංක්ෂිප්ත බව

★ සත්‍ය නිවැරදි තොරතුරු ඇතුළත් කිරීම

★ ආකර්ෂණීය මාතෘකාවක් යෙදීම

★ තම අත් අකුරින් පිරවිය යුතු වීම

★ අදාළ නොවන තොරතුරු නොසැපයීම

★ ආකර්ෂණීය බව

★ විවිධ වර්ණ භාවිත කිරීම

දැන්වීම්

ආකෘති පත්‍ර

ක්‍රියාකාරකම 5 - පහත සඳහන් තොරතුරු පත්‍රිකාව සම්පූර්ණ කරන්න .

## ශිෂ්‍ය තොරතුරු පත්‍රිකාව - 8 ශ්‍රේණිය

1 . සම්පූර්ණ නම :- ....................................................................................................

2 . මුලකුරු සමග නම :- ....................................................................................................

3. උපන් දිනය :- අවු ; ..................... මාස ................. දින .........................

2021 . 01 . 01 වයස :- අවු ; ..................... මාස ................. දින .........................

4. ස්ත්‍රී /පුරුෂ බව :- ....................................................................................................

5 . ජන වර්ගය :- ....................................................................................................

6 . ආගම :- ....................................................................................................

7. ස්ථිර පදිංචි ලිපිනය :- ....................................................................................................

8 . ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසය :- ....................................................................................................

9. ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය :- ....................................................................................................

10 . දිස්ත්‍රික්කය :- ....................................................................................................

11 . පාසලට ඇතුළත් වූ වර්ෂය :- ....................................................................................................

12 . ඇතුළත්වීමේ අංකය :- ....................................................................................................

13 . ඉගෙනුම ලබන මාධ්‍ය :- ....................................................................................................

14 . පාසලට පැමිණෙන ආකාරය :- ....................................................................................................

15 . මව /පියා /භාරකරුගේ නම :- ....................................................................................................

ඉහත සඳහන් තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බව සහතික කරමි

දිනය .............................. ..................................................

අත්සන



අලුත් අවුරුද්දේ අලුත් පන්තියට

පිය නගන ඔබට

විශේෂ වට්ටම් සහිතව ලාබෙට පොත්




ඔබට අවශ්‍ය

- ★ අභ්‍යාස පොත්
- ★ පෑන් ,
- ★ පැන්සල් සහ
- ★ සියලු ලිපිද්‍රව්‍ය
- ★ නවකතා
- ★ කෙටිකතා
- ★ පරිවර්තන
- ★ ළමා කතා



- ★ බණ කතා
- ★ සිංහල ,දෙමළ ,ඉංග්‍රීසි ශබ්දකෝෂ

★ සියලු පොත් සඳහා 20% ක වට්ටමක් සහිත ව ඉතා පහසු මිලට ලබා ගැනීමට අදම එන්න

කෑගල්ල මහා වීදියේ,

## විජය පොත්හලට

සතියේ සෑම දිනකම පෙ .ව. 9.00 සිට ප .ව . 9.00 දක්වා ඔබ වෙනුවෙන් විවෘතයි. (පෝය දින පමණක් වසා ඇත . )

මෙම අනගි අවස්ථාව දෙසැම්බර් 01 සිට දෙසැම්බර්31 දක්වා පමණයි

විජය පොත්හල,
අංක 10 , මහා වීදිය,
කෑගල්ල.

2021 .08 .15

# පිළිතුරු



**Answer**

| 8 ශ්‍රේණිය | සිංහල | කාලය පැය 1 |
|---|---|---|

1.

# කෝවිඩ් 19 හෙවත් කොරෝනා මර්දනය කරමු

## ✓ කෝවිඩ් 19 / කොරෝනා රෝග ලක්ෂණ.



- බිඳිති මාර්ගයෙන් මෙම රෝගය අන් අයට බෝවේ.
- වෛරස් මඟින් බෝවෙන රෝගයකි.
- දැනට නිශ්චිතව ප්‍රතිකාරයන් සොයාගෙන නොමැත.
- උණ, කැස්ස, සෙම්ප්‍රතිශ්‍යාව, හුස්ම ගැනීමේ අපහසුව ඇතිකරයි.
- මරණය පවා ඇතිකළ හානිය.
- වෙනස් බෝ නොවන රෝග සහිත අයට අවධානම වැඩිය.

> කුඩා දරුවන් සහ වයස්ගත අයට රෝගය බෝවූ විට අතුරු ආබාධ ඇති වීම වැඩිය.



## ✓ කොරෝනා හෙවත් කොවිඩ් 19 මර්දනයට ගත හැකි පියවර

- තත්පර 20 ක් සබන් හෝ විෂබීජ නාසන දියරයකින් දෑත් සේදීම
- සමාජ දුරස්තභාවය රැක ගැනීම
- මුඛ ආවරණ සහ අත් ආවරණ පැළඳීම
- භාණ්ඩ මිලදී ගැනීමේදී හා විකිණීමේදී සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරීම.
- පොදු ප්‍රවාහන සේවා පරිහරණයේදී සැලකිලිමත් වීම.
- පාසැල් හා පොදු ස්ථාන විෂබීජ හරණය කිරීම

"දේශීය ප්‍රතිශක්තිය කරන ක්‍රම වන කොත්මල්ලි, ඉඟුරු, සුදුලූණු, වෙනිවැල්ගැට, පත්පාඩගම් ආදිය,පානයකිරීම, වාෂ්ප දුම ඇල්ලීම, විවේකය ආදිය තුළින් රෝගයම අවශ්‍ය ප්‍රතිශක්තිය දියුණු කළ හැකිය."

නාලන්ද විද්‍යාලයීය සෞඛ්‍යදාන ව්‍යාපාරයේ නියමු භට කාණ්ඩය නාලන්දා විද්‍යාලය කොළඹ 10.

2.

- ✓ ආකෘති පත්‍රය පිරවීම සඳහා උපදෙස් දී ඇත්නම් ඒවා කියවිය යුතු ය.
- ✓ ආකෘති පත්‍රයේ සඳහන් කරුණු හොඳින් කියවා තේරුම් ගෙන අසා ඇති තොරතුරු සම්පූර්ණ කළ යුතු ය.
- ✓ සඳහන් කළ යුතු කරුණු ඉතා කෙටියෙන් දැක්විය යුතු ය.
- ✓ සත්‍ය වූ ද නිවැරදි වූ ද තොරතුරු දැක්විය යුතු ය.
- ✓ තමා විසින් සම්පූර්ණ නොකළ යුතු තැන් ඇතොත් ඒවා හිස්ව තැබිය යුතු ය. (ඒවා කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා ය.)
- ✓ මකන දියර වර්ග භාවිත නොකළ යුතු ය.
- ✓ වැරදුණ හොත් තනි ඉරකින් කපා කෙටි අත්සනක් යෙදිය යුතු ය.
- ✓ සුපුරුදු අත්සන යෙදිය යුතු ය.

3.

| | |
|---|---|
| ✓ මුල'කුරු සමග නම | : C.U.A. දිනිදු නුගවෙල |
| ✓ උපන් දිනය | : 2009 - 03 - 12 |
| ✓ ස්ත්‍රී/පුරුෂ භාවය | : පුරුෂ |
| ✓ විවාහක/අවිවාහක බව | : අවිවාහක |
| ✓ පුරවැසි භාවය | : ශ්‍රී ලාංකික |
| ✓ පෞද්ගලික ලිපිනය | : 193 ඩීන්ස් පාර, මරදාන, සුදුවැල්ල, කො. 10 |
| ✓ විද්‍යුත් ලිපිනය | : ushan999@gmail com |
| ✓ දූරකථන අංකය | : 0772147555 |
| ✓ හැඳුනුම්පත් අංකය | : 2009031214v |
| ✓ පළාත | : බස්නාහිර පළාත |
| ✓ දිස්ත්‍රික්කය | : කොළඹ |
| ✓ ප්‍රා. ලේකම් කාර්යාලය | : තිඹිරිගස්යාය |
| ✓ මැතිවරණ කොට්ඨාසය | : සුදුවැල්ල |
| ✓ පොලිස් බල ප්‍රදේශය | : මරදාන |
| ✓ පළාත් සභා බල ප්‍රදේශය | : මැද කොළඹ |
| ✓ ප්‍රා. සභා බල ප්‍රදේශය | : තිඹිරිගස්යාය |
| ✓ ග්‍රාම නි. කොට්ඨාසය | : සුදුවැල්ල |
| ✓ ග්‍රාම නිලධාරි අංකය | : 1-1-03-140 C 34 |
| ✓ ඉගෙනුම ලැබූ පාසල | : ආනන්ද විද්‍යාලය |
| ✓ අධ්‍යාපන සුදුසුකම් | : මෙවර 2022 උසස් ගණිත අංශයෙන් ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටිමි. |

(සා. පෙළ ප්‍රතිඵල ලේඛනය මේ සමග අමුණා ඇත. *)

✓ වෙනත් සුදුසුකම් : වෘත්තීය පුහුණු පාඨමාලවක් හදාරමින් සිටිමි.

- ඔබගේ “සින්ටෙක්ස්” පෞද්ගලික ආයතනයේ සුදුසු රැකියාවක් බලාපොරොත්තු වෙමි.
- ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික වෙමි.

දිනය :- 2022 - 07 - 20

.............................

අත්සන



👍 👍 👍 👍 👍 👍 👍 👍 👍 👍 👍 👍 👍

# ප්‍රායෝගික ලේඛන

❖ පිළිතුරු

## ක්‍රියාකාරකම 1

1 . ප්‍රායෝගික ලේඛන
2 . සංක්ෂිප්ත බව
3 . දැන්වීම් පත්‍ර
4 . ආකෘති පත්‍ර
5. අත්සන

## ක්‍රියාකාරකම 2

1 . √
2 . √
3 . X
4 . √
5 . √
6 . √
7 . X
8 . √
9 . √
10 . X

## ක්‍රියාකාරකම 3


1 . පොලිතින්
2 . පාංශු ජීවීන් විනාශ වීම
3 . දෙසීයක
4 . පත්
5 . පරිසරය
6 . මිතුරු
7 . කෙසෙල්
8 . සතුන්

• 

## ක්‍රියාකාරකම 4

**ගැළපෙන කරුණු යා කරන්න**

★ සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් දී තිබේ දැයි පරීක්ෂා කිරීම
★ නම ලිපිනය ලිවීමට කොටු තිබීම
★ විවිධ ප්‍රමාණයේ අකුරු භාවිත
★ සංක්ෂිප්ත බව
★ සත්‍ය නිවැරදි තොරතුරු ඇතුළත් කිරීම
★ ආකර්ෂණීය මාතෘකාවක් යෙදීම
★ තම අත් අකුරින් පිරවිය යුතු වීම
★ අදාළ නොවන තොරතුරු නොසැපයීම
★ ආකර්ෂණීය බව
★ විවිධ වර්ණ භාවිත කිරීම



අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු සිංහල ගණිතය සහ විද්‍යාව විෂය වලට අයත් මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා මෙම නිබන්ධනය යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප 3in1 Youtube නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

ස්තූතියි !

හසිත හෙට්ටිආරච්චි
**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**



3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ